රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 02/2014 (II)

මගේ අංක : PSC/EST/07-07/01/2014

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර
නාරාහේන්පිට ,කොළඹ 05.

2015 සැප්තැම්බර් මස 17 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවයේ "සක්‍රීය සේවා කාලය " පිළිබඳව අර්ථ නිරූපනය.</u>**

රාජ්‍ය සේවය සම්බන්ධව සක්‍රීය සේවා කාලය යන්නෙහි අර්ථ නිරූපනය පහත සඳහන් පරිදි විය යුතු බව 2015.09.08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

**"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන , එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."**

ඒ අනුව, 2014.01.28 දින නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 02/2014 මෙයින් සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

තවද, 2015.05.13 දින නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2014(1) මෙයින් අවලංගු කරමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ශාන්ති ගුණතිලක
ලේකම් (වැ.බ)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත් - අග්‍රාමාත්‍ය ලේකම්.

- අමාත්‍ය මණ්ඩල ලේකම්.
- ආයතන අධ්‍යක්ෂ ජනරාල්.